# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 41 දරන මඩකලපුව තරුණ හින්දු සංගමය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 ජූලි මස 13 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජූලි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ** : රු. **4.50 යි**. තැපැල් ගාස්තුව : රු. **2.50 යි**.

**1998 අංක 41 දරන මඩකලපුව තරුණ හින්දු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1998 ජූලි මස 13 වන දින.]

ඇල්. ඩී.—ඕ. 38/93.

**මඩකලපුව තරුණ හින්දු සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"මඩකලපුව තරුණ හින්දු සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් මඩකලපුවේ පිහිටුවා ගෙන තිබුණ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවන ලද්දේ කවර පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කොට සහ ඉටුකොට ඇති හෙයින් ද එකී සංගමය නීතිගත කිරීමට ඉල්ලා ඇති හෙයින් සහ එම ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මෙම පනත 1998 අංක 41 දරන මඩකලපුව තරුණ හින්දු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන මඩකලපුව තරුණ හින්දු සංගමයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසු, මඩකලපුව තරුණ හින්දු සංගමය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තවද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. මඩකලපුව තරුණ හින්දු සංගමය සංස්ථාගත කිරීම.

2—D 038594—5,900 (95/12)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මඩකලපුවේ තිවැසි තරුණ තරුණියන්ගේ අධ්‍යාත්මික, බුද්ධිමය, සමාජයීය සහ ශාරීරික ශුභ සාධනය ප්‍රවර්ධනය කිරීම ;

(ආ) විද්‍යාව සහ සාහිත්‍යය අධ්‍යයනය කිරීම ඔවුන් අතර ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) පුස්තකාල, කියවීම් ශාලා, ශාරීරික අභ්‍යාස මධ්‍යස්ථාන සහ පොදු යහපත සඳහා වූ වෙනත් ස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඈ) සමාජ සේවා කටයුතුවල නියැලීම සහ රජය විසින් භාරගෙන තිබෙන සහනාධාර, පුනරුත්ථාපන සහ නිවාස සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට සහායවීම ; සහ

(ඉ) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ල ම හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය, සියලු ක්‍රියා, කාරණා සහ දේ සිදුකිරීමේ, ඉටුකිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ ධුරදරන්නන්ගෙන් සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන, වෙනත් සාමාජිකයින් දොළොස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වන, භාරකාර මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ ඔවුන් ඇතුළත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම :

(ආ) ධුරදරන්නන් තෝරා පත් කර ගැනීම, ධුරදරන්නන් ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය :

(ඇ) භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් තෝරා පත් කර ගැනීම, භාරකාර මණ්ඩලයේ බලතල, චර්යාව සහ කාර්ය :

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය :

(ඉ) සංස්ථාවේ භාරකාර මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම, ඒ රැස්වීම් පැවැත්වෙන වේලාව සහ ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු :

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ ඒවා විගණනය කිරීම : සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**7.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලැබූ යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර එවැනි සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, මේ පනතේ කාර්යය සඳහා, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ ගෙවනු ලැබිය යුතුව තිබුණු දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**9.** භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයින් දෙදෙනා පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් වෙතින්, ඔවුන් මගින් හා ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.